සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

**Grade 8 – First Term Test - April 2019**
**පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 8 ශ්‍රේණිය**

කාලය- පැය 02
**Time – 2 hours**

# History I
# ඉතිහාසය I

**Name ............................................ Grade-................. Index Number-..................**

## I කොටස

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

- **අංක 1 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) මල්වතුඔය හරස්කර ඉදිකර ඇති තේක්කම් අමුණින් ආරම්භ වන ඇළ මගින් ජලය ගෙනයනු ලබන වැව කුමක්ද?

1. යෝධ වැව 2. හුරුළු වැව 3. කලා වැව 4. මින්නේරිය වැව

(2) ආර් එල්. බ්‍රෝහියර් මහතා විසින් රචිත 'ලක්දිව පුරාණ වාරි මාර්ග' යන කෘතියේ සඳහන් වන්නේ

1. වැසි ජලය ක්‍රමානුකූලව බැහැර කිරීමේ උපක්‍රම පිළිබඳවයි.
2. ස්ථාවර වේල්ලක් ඉදිකිරීමේ තාක්ෂණය පිළිබඳවයි
3. සීගිරියේ ජලමල්වල ක්‍රියාකාරීත්වය පිළිබඳවයි
4. ඇලහැර ඇළ තැනවීමේදී මුහුණ දුන් අභියෝග පිළිබඳවයි

(3) * මහ වැව් තැනවූ රජවරු අතර කැපී පෙනෙන රජකෙනෙකි.
* මෙතුමා වැව් දහසක් තැනවූ බව මහාවංසයේ සඳහන් වේ
* හුරුළු වැව මෙතුමාගේ නිර්මාණයකි

1. ධාතුසේන රජතුමා 2. දේවානම් පියතිස්ස රජතුමා
3. මහසෙන් රජතුමා 4. වසභ රජතුමා

(4) * වැව් ජලය මනා පාලනයකින් යුක්තව ඉවතට ගැනීමට මෙය නිර්මාණය කර ඇත.
* මෙතුළ උස් පහත් කළ හැකි පියන්පතක් සකස් කර ඇත
* නල මාර්ගයක් ඔස්සේ මෙයට ජලය ඇතුළු වේ.

1. ඇතුළු වාන 2. බිසෝ කොටුව
3. සොරොව්ව 4. රළපනාව

(5) විජය කුමරු මෙරටට ගොඩබසින විට කුවේණිය පොකුණක් අසල කපු කටිමින් සිටි බව දැක්වෙන පුවත සඳහන් වන්නේ,

1. චූලවංසයේය 2. මහාවංසයේය
3. බෝධිවංසයේය 4. දීපවංසයේය

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

(6) පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ ප්‍රධාන හේතුව වූයේ කාලිංග මාඝගේ ආක්‍රමණයයි. මෙම ආක්‍රමණය සිදුවූයේ

1. ක්‍රි.ව. 1210 දිය   2. ක්‍රි.ව. 1315 දිය   3. ක්‍රි.ව. 1215 දිය   4. ක්‍රි.ව. 1310 දිය

(7) රොන්මඩ හා අපද්‍රව්‍ය පොකුණට එක්වීමට පෙර ඉවත්කිරීම සඳහා පොකුණු නිර්මාණයේදී යොදාගත් උපක්‍රමය කුමක්ද?

1. ජල නලය ඍජුවම පොකුණට යොමු නොකර පිටත පෙරණයකට යොමු කිරීමයි
2. බැම්මකින් පොකුණ ආවරණය කිරීමයි
3. ඉවුරේ ඉහළ ගල් පුවරු පොළොව මට්ටමට වඩා ඉහලින් තනවා තිබීමයි
4. පොකුණට බැසීමට පෙර ඒ අසළ පා දෝවනය සඳහා ජලය පිරවූ පා දෝවනයක් තිබීම

(8) රජවරුන් හා ඔවුන් කරවූ ඇළ මාර්ග කිහිපයක් පහතින් දක්වා ඇත. ඒවා අතුරින් නොගැලපෙන පිළිතුර තෝරන්න.

1. වසභ රජු - ඇළහැර ඇළ   2. දෙවන අග්බෝ රජු - මිනිපේ ඇළ
3. ධාතුසේන රජු - යෝධ ඇළ   4. මහසෙන් රජු - තල්වත්තු ඇළ

(9) ශ්‍රී ලංකාවේ පුරා විද්‍යා කැණීම් අතරින් වැඩි ප්‍රමාණයක් හමුවන්නේ

1. ගල් ආශ්‍රිත නිර්මාණය   2. මැටි ආශ්‍රිත නිර්මාණය
3. ලෝහ ආශ්‍රිත නිර්මාණය   4. දැව ආශ්‍රිත නිර්මාණය

(10) සකපෝරුව සොයාගැනීම නිසා විශාල වර්ධනයක් ඇතිවූයේ කවර කර්මාන්තයේද?

1. රන් කර්මාන්තයේය   2. යකඩ කර්මාන්තයේය
3. මැටි කර්මාන්තයේය   4. කපු කර්මාන්තයේය

- **අංක 11 – 15 දක්වා ප්‍රශ්න සඳහා ගැලපෙන නිවැරදි අක්ෂරය තෝරා ඉදිරියේ ඇති කොටුවෙහි සඳහන් කරන්න.**

| | | |
|---|---|---|
| (11) අලංකාරය, ජලපරිභෝජනය හා පරිසරය සිසිල්ව තබා ගැනීම යන අරමුණු තුනම මුල් කරගෙන ඉදිකළ පොකුණකි. | ☐ | A. මහා මේඝ වනය |
| (12) අලංකාරය සඳහා ඉදිකළ පොකුණකි | ☐ | B. රජගල පුරාවිද්‍යා භූමියේපොකුණු |
| (13) පරිසරය සිසිල්ව තබාගැනීම සඳහා පමණක් ඉදිකළ පොකුණකි. | ☐ | C. ජෝති වනය |
| (14) මෙරට මුල්වරට තනවන ලද උයන වන්නේ | ☐ | D. කුට්ටම් පොකුණ |
| (15) අතීතයේදී මිහිඳු හිමියන් වැඩ සිටිමින් ධර්මය දේශනා කළ උයන වන්නේ | ☐ | E. කුමාර පොකුණ |

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

(16) ශ්‍රී ලාංකීය ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් වරයා නම් කරන්න. ..........................................

.............................................................................................................................

(17) දකුණු ආසියාවේ ඇති පැරණි ජල උද්‍යාන අතරින් මෙරට පිහිටි පැරණිතම ජල උද්‍යානය නම් කරන්න.

.............................................................................................................................

(18) අනුරාධපුරයේ මහා විහාරය, අභයගිරිය, ජේතවනාරාමය ආශ්‍රිතව ඉදිකළ උද්‍යාන හඳුන්වන්නේ කවර නමකින්ද?

.............................................................................................................................

(19) මෙරට මුල්වරට උයනක් ඉදිකළ රජු නම් කරන්න

.............................................................................................................................

(20) කුටකණ්ණතිස්ස රජු විසින් ඉදිකළ උයන නම් කරන්න.

.............................................................................................................................

(ලකුණු 2x20=40)

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 8 – First Term Test - April 2019

පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 8 ශ්‍රේණිය

## History II


ඉතිහාසය II

Name ............................................... Grade-.................. Index Number-....................

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ
- අනෙක් ප්‍රශ්න අතරින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(1) A, B හා C වශයෙන් දක්ව ඇති පින්තූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(A)




i. A පින්තූරයෙන් දක්නට ලැබෙන වැව නම් කරන්න.

ii. මෙම වැව සෑදූ රජු නම් කරන්න

iii. මෙතුමා ඉදිකළ වෙනත් වැවක් ලියා දක්වන්න

iv. මෙම වැව පිහිටා ඇති නගරය නම් කරන්න. (ලකුණු 04)

(B)



I. B පින්තූරයේ දැක්වෙන නිර්මාණයේ නම ලියන්න


II. එය පිහිටා ඇති නගරය නම් කරන්න.

III. එය අයත් වන්නේ කුමන විහාර සංකීර්ණයකට ද?

iv. මෙය නිර්මාණය කරනු ලැබුවේ සමාජයේ කවර පිරිසකගේ පරිහරණය සඳහාද? (ලකුණු 04)

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

(C)



i C පින්තූරයේ දැක්වෙන නිර්මාණයේ නම ලියන්න

ii. මෙය කුමන යුගයකට අයත් වීද?

iii. මෙය ඉදිකිරීමේ අවශ්‍යතාවය කුමක් ද?

iv මෙය ඉදිවූ යුගයට අයත් තවත් මෙවැනි නිර්මාණයක් නම් කරන්න.

(ලකුණු 04)

(සම්පූර්ණ ලකුණු - 4x3 = 12)

(2)

i. ජල තාක්ෂණය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 03)

ii. ඈත අතීතයේදී ගම්වල ඉදිකරන ලද කුඩා වැව් ඉදිකරන ලද ආකාර දෙකක් ලියන්න.(ලකුණු 04)

iii. අතීතයේදී ජනතාව විසින් මහ වැව් තැනවීමට හේතුවූ සාධක දෙකක් සඳහන් කර ඒවා කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 05)

(3)

i. ඉතිහාසයේ සඳහන් ආකාරයට මුලින්ම තනවන ලද වැව් තුන නම් කරන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| වැව | ඉදිකළ රජතුමා | අතීතයේදී වැව හැඳින්වූ නම |
|---|---|---|
| 1. මින්නේරිය වැව | | |
| 2. මහාකනදරා වැව | | |

(ලකුණු 04)

iii. විශාල වැව් තැනවීම නිසා ලාංකිකයන් ලැබූ ජයග්‍රහණ දෙකක් සඳහන් කර ඒවා කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 05)

(4) (I) පහත සඳහන් කාර්යයන් හා සම්බන්ධ වන්නේ වැවෙහි කුමන අංගයන්ද යන්න ඉදිරියෙන් ලියන්න

a) වෙනත් ජලමූලාශ්‍රයකින් වැවට ජලය ලබාගැනීම -


b) වැවෙහි අතිරික්ත ජලය පිට කිරීම-

c) අධි පීඩනයක් සහිතව වැව තුළ පවතින ජලය වැව් බැම්ම හරහා ඇළ මාර්ගවලට යැවීම

(ලකුණු 03)

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

**(II)**



a) මෙහි දැක්වෙන උයන නම් කරන්න
b) එම උයනට අයත් වූ ප්‍රදේශය ලියන්න
c) මෙය නිර්මාණය කරනු ලැබුවේ කවර පිරිසකගේ පරිහරණය සඳහාද?
d) මෙහි තනවා ඇති පොකුණු යොදාගෙන ඇත්තේ කවර කාර්යයක් සඳහාද?

(ලකුණු 04)

**(III)** අතීතයේදී විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා පොකුණු තනවා ඇත. ඒ ආකාරයට ඉදිවූ පොකුණු වර්ග තුනක් නම් කර ඉන් දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
(ලකුණු 05)

**(5)**

i. අතීතයේදී රජවරු උයන් තැනවීම සඳහා සිය අනුග්‍රහය ලබාදීම සිදුවිය. එවැනි වූ රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)
ii. ජල උද්‍යානවල කැපී පෙනෙන ලක්ෂණ හතරක් ලියන්න (ලකුණු 04)
iii. සීගිරිය ජල උද්‍යානයේ ඇති ජල මල් නිර්මාණය කිරීමට යොදාගෙන ඇති තාක්ෂණය කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

**(6)** අතීත්යේ සිටම මිනිසා විවිධ වූ නිර්මාණ කිරීම සඳහා තාක්ෂණික ක්‍රම යොදාගනු ලැබීය.

i. මැටි තාක්ෂණයේදී මැටි භාණ්ඩයක් සකස් කිරීම සඳහා යොදාගන්නා පියවර තුනක් ලියන්න.
(ලකුණු 03)
ii. ක්‍රිස්තුපූර්ව තුන්වන සියවසේ සිට ලෝහ තාක්ෂණය හා ලෝහ වර්ග භාවිතායේ සීඝ්‍ර දියුණුවක් ඇතිවිය. එයට හේතුවූ කරුණු 4 ක් ලියන්න. (ලකුණු 04)
iii. යකඩ නිස්සාරණය කිරීම සඳහා යොදාගත් උදුන් ඇති ස්ථාන දෙකක් නම් කර එම ස්ථානයන්හි යකඩ නිස්සාරණය සිදුවූ අයුරු වෙන් වෙන්ව පැහැදිලි කරන්න. (ලකුණු 05)